**C**

# නිවේදනය

**2016 මාර්තු මස 10 වැනි බ්‍රහස්පතින්දා මුදල් අමාත්‍ය ගරු රවී කරුණානායක මහතා විසින් පාර්ලිමේන්තුවේ වයිෆයි පහසුකම් සම්බන්ධයෙන් සභාගර්භයේදී මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මෙම සභාවට නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.**

**පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණයට අදාළව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ පහසුව පිණිස පාර්ලිමේන්තු වෙබ් සයිට් (Parliament Website), ඊමේල් (e-mail), අයි පාලියමන්ට් ඉන්ට්‍රානෙට් පෝටල් (i-Parliament intranet portal), මොබයිල් ඇප් (mobile app), හා වයිෆයි (wifi) යනාදී පහසුකම් දැනටමත් සම්පාදනය කර ඒවා දැනට ක්‍රියාත්මකව පවතින බව දන්වා සිටිමි.**

පාර්ලිමේන්තුවේ වයඵයි ජාලයට සම්බන්ධවීමේදී ඕපන් ඇක්සෙස් (**open access**) සහ ක්ලැසිෆයිඩ් ඇක්සෙස් (**classified access**) යනුවෙන් ආකාර දෙකකට ඊට සම්බන්ධවීමට හැකියාව තිබෙන අතර ක්ලැසිෆයිඩ් ඇක්සෙස් (**classified access**) ඔස්සේ අන්තර්ජාලයට පිවිසීමේදී වැඩි කාර්යක්ෂමතාවයකින් හා ගුණාත්මක භාවයකින් යුක්ත සේවාවක් ලබාගත හැකි බව සඳහන් කරමි. ඒ සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාට දී තිබෙන යූස(ර්) නේම් (**user name**) හා පාස්ව(ර්)ඩ් (**password**) ඇතුළත් කළ යුතු බව අවධානය යොමු කරවමි.

මේ සම්බන්ධයෙන් දැනටමත් යූස(ර්) නේම් (**user name**) හා පාස්ව(ර්)ඩ් (**password**) ලබාගෙන නොමැති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් අදාළ විස්තර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා

සිටින අතර මෙවැනි පරිගණක පහසුකම් සම්බන්ධයෙන් යම් පුහුණුවීමක් අවශ්‍ය ගරු මන්ත්‍රීතුමන්ලා ඒ පිළිබඳව මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසද මෙයින් දන්වා සිටිමි.